T- 72

# අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව

පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයේ
(කැලණිය විශ්වවිද්‍යාලය)
දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන
ස්වාධීන පර්යේෂණ නිබන්ධය

වැලිමඩගම කුසලධම්ම හිමි
**2005/M.Phil/953**

2008 මාර්තු

# හැඳින්වීම

වසර දහස් ගණනක් වන ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ ප්‍රකටතම යුගයක් ලෙස අනුරාධපුර යුගය (ක්‍රි. පූ. 03 සියවසේ සිට ක්‍රි. ව. 10 සියවස දක්වා) සැලකිය හැකි ය. මෙම යුගය තුළ ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ ආරම්භයත්, සැලකිය යුතු සංවර්ධනයකුත් සිදු වී තිබේ. අනුරාධපුර යුගයේ බෞද්ධ සංස්කෘතිය හා ඉතිහාසය පිළිබඳ විසිවන සියවසේ දී විවිධ විද්වතුන් විසින් පර්යේෂණ ගණනාවක් සිදුකොට එළි දක්වා තිබේ. ඒ අතර ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම් මහතා පාලි අට්ඨකථා මූලාශ්‍රය කරගනිමින් ක්‍රි. පූ. 03 වන සියවසේ සිට ක්‍රි. ව. 05 වන සියවස දක්වා බුදුසමයේ ඉතිහාසය ''පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය'' නමින් එළි දක්වා තිබේ. එසේ ම මහාචාර්ය වල්පොල රාහුල හිමියන් ක්‍රි. පූ. 03 වන සියවසේ සිට ක්‍රි. ව. 10 වන සියවස දක්වා අනුරාධපුර යුගයේ බෞද්ධ ඉතිහාසය භාවිත කළ හැකි සියලු මූලාශ්‍රය භාවිත කරමින් "ලක්දිව බුදු සමයේ ඉතිහාසය" නමින් එළි දක්වා තිබේ. මෙම පර්යේෂණ දෙක මෙම යුගයේ බුදුසමයේ තත්වය පිළිබඳ එළි දුටු ප්‍රකටතම කෘතීන් දෙකක් ලෙස සැලකිය හැකි ය.

ඉහත කෘති දෙක මගින් අපගේ විමර්ශනයට බඳුන්වන බෞද්ධ භික්ෂුව පිළිබඳ අවධානය යොමුව ඇතිමුත් එම බෞද්ධ සංස්කෘතියේ ප්‍රබලතම භූමිකාවක් නිරූපණය කරන භික්ෂුවගේ ජීවිතයේ සියලු අංශ කෙරෙහි අවධානය ගැඹුරින් හා ප්‍රමාණවත් අයුරින් යොමු වී ඇති බවක් නොපෙනේ. තව ද, ආචාර්ය ගුණරත්න පානබොක්කේ මහතාගේ "History of the Buddhist Sangha in India and Sri Lanka"නම් පර්යේෂණ කෘතිය මේ විෂය පිළිබඳ ව රචිත කෘතියක් වුව ද එමගින් ඉන්දියාව හා ශ්‍රී ලංකාවේ ආරම්භයේ සිට යුග ගණනාවක් පුරාවට භික්ෂු ජීවිතය පිළිබඳ අවධානය යොමු වී ඇති හෙයින් අනුරාධපුර යුගයේ භික්ෂු ජීවිතය පිළිබඳ පුළුල් විමර්ශනයක් ඒ තුළ සිදු වී නොමැති බව පෙනේ. මේ හේතුව නිසාම ''අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව'' නමින් වූ මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ එම යුගයේ භික්ෂු ජීවිතයේ සියලු අංශ පාලි ත්‍රිපිටකය, පාලි අට්ඨකථා, වංස කථා, සිංහල සාහිත්‍ය ග්‍රන්ථ, ශිලා ලේඛන ආදී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිත කළ හැකි සෑම මූලාශ්‍රයක් ම භාවිත කරමින් විමර්ශනයට ලක් කිරීමයි. එහි දී ආදී බෞද්ධ මූලාශ්‍රය මගින් බෞද්ධ භික්ෂුවට පැවරී ඇති කාර්යභාරය හඳුනා ගනිමින් එය ඉටුකිරීමට අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව කෙතෙක් දුරට කටයුතු කොට ඇත්දැයි විමසා බැලීම ද සිදු වේ.

මෙම පර්යේෂණ නිබන්ධයේ පළමු පරිච්ඡේදය මගින් ආදි බෞද්ධ මූලාශ්‍රය වන සූත්‍ර හා විනය පිටක ප්‍රධාන වශයෙන් ඇසුරු කරමින් ආදි භික්ෂු ජීවිතයේ ආරම්භය, ඒ සඳහා බලපෑ පසුබිම, එම භික්ෂු සමාජයේ වර්ධනය හා ඒ සඳහා බලපෑ හේතු සාධක විමර්ශනය කිරීම සිදු වේ. එසේ ම එම මූලාශ්‍රය මගින් හඳුනාගත හැකි ආකාරයට භික්ෂු ජීවිතයේ අරමුණු හා පරමාර්ථ මුල් කොටගත් බෞද්ධ භික්ෂුවට පැවරෙන කාර්යභාරය හඳුනා ගැනීමට ද අපේක්ෂා කෙරේ.

ආදි බෞද්ධ මූලාශ්‍රය මගින් බෞද්ධ භික්ෂුවට පැවරෙන කාර්යභාරය හා එම භික්ෂු ජීවිතයේ ස්වරූපය හඳුනා ගැනීමෙන් පසු එම භික්ෂු සමාජයෙන් අඛණ්ඩ වූ භික්ෂු ජීවිතය ශ්‍රී ලංකාවට හඳුන්වාදීම පිළිබඳ දෙවන පරිච්ඡේදයේ දී අවධානය යොමු වෙයි. එහි දී ආදී භික්ෂු සමාජයත් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් භික්ෂු සමාජයත් අතර වූ අඛණ්ඩ බව හඳුනා ගනිමින් ආදි භික්ෂු ජීවිතයට බෙහෙවින් සමීප වූ භික්ෂු සමාජයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ආකාරය හඳුනාගැනීමට උත්සාහ කෙරේ. එපමණක් නොව එම භික්ෂු සමාජය හඳුන්වාදීම පිළිබඳ සාහිත්‍ය මූලාශ්‍රයන්හි සඳහන් සාම්ප්‍රදයික කථා ප්‍රවෘත්තිය වඩාත් විශ්වසනීය මූලාශ්‍රය ලෙස සැලකිය හැකි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඔස්සේ තහවුරු කර ගැනීමට අපේක්ෂාකෙරේ. එසේ ම ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් භික්ෂු සමාජය ඉතා සීමිත කාල සීමාවක් තුළ වර්ධනය වීම හඳුනා ගනිමින් ඒ සඳහා බලපෑ හේතු සාධක ද විමර්ශනය කෙරේ. තව ද ශ්‍රී ලංකාව තුළ භික්ෂුවගේ ප්‍රධාන වාසස්ථානය වූ ආරාමය කේන්ද්‍ර කොටගත් ජීවිතයේ ස්වරූපයත් විමසා බලනු ලැබේ.

අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව ආදී බෞද්ධ මූලාශ්‍රය මගින් භික්ෂුවට පැවරුණු ප්‍රධාන කාර්යභාරය ලෙස සැලකිය හැකි ආගමික කාර්යභාරය ඉටුකිරීමට කටයුතු කොට ඇති ආකාරය මෙම නිබන්ධයේ තෙවන පරිච්ඡේදය මගින් විමර්ශනය කෙරේ. එහි දී ආදී බෞද්ධ මූලාශ්‍රයට අනුව යමින් භික්ෂුවගේ ආගමික කාර්යභාරය අධ්‍යාත්මික කාර්ය සාධනය, ප්‍රාතිමොක්ෂ සංවරය, ධර්මධාරීත්වය යනුවෙන් කොටස් තුනක් යටතේ හඳුනා ගනිමින් එම කාර්යයන් ඉටුකිරීම විෂයෙහි අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව කටයුතු කොට ඇති ආකාරය විමර්ශනයට ලක් කෙරේ. එහි දී නිර්වාණය නිෂ්ඨාව කොටගත් අධ්‍යාත්මික කාර්ය සාධනය සඳහා අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව කටයුතු කොට ඇති ආකාරයත්, ඒ සඳහා උදාහරණත්, භික්ෂුවගේ ආගමික කාර්යභාරයට අයත් වූ විනය අනුගමනය කිරීම, සංවර්ධනය කිරීම හා විනය හා සමගාමී විවිධ ක්‍රියා මාර්ග විෂයෙහි අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුවගේ ක්‍රියා කලාපයත් හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ. භික්ෂුව සතු වූ ධර්මධාරීත්වය පිළිබඳ ඉන්පසු අවධානය යොමු වේ.

ආධ්‍යාත්මික අරමුණ භික්ෂු ජීවිතයක ප්‍රමුඛ කාර්ය ලෙස සැලකුණ ද, සාමාජීය කාර්යභාරය ද භික්ෂුවගේ කාර්යභාරයට අයත්වන බව පැහැදිලි ය. ඒ හේතුවෙන් ම සිව්වන පරිච්ඡේදය මගින් අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව භික්ෂුවට පැවරෙන සාමාජීය කාර්යභාරය ඉටුකිරීමට කටයුතු කොට ඇති ආකාරය ගවේෂණයට ලක්කෙරේ. එහි දී භික්ෂුවගේ සමාජ කාර්යභාරය ප්‍රධාන කොටස් තුනක් යටතේ අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ. එනම් අධ්‍යාපන, ග්‍රන්ථකරණය හා ජාතික කාර්යභාරය වශයෙනි. ජනසමාජය වෙත ධර්මය ගෙන යාම ආදි බෞද්ධ මූලාශ්‍රයෙන් භික්ෂුවට පැවරී ඇති ප්‍රධාන කරුණකි. එම කරුණ ඉටුකිරීම සඳහා අනුරාධපුර යුගයේ භික්ෂුව යොදා ගත් ප්‍රබල ක්‍රමවේද දෙකක් ලෙස අධ්‍යාපනයත්, ග්‍රන්ථකරණයත් සැලකිය හැකි බැවින් ඒ පිළිබඳ ව මෙහි දී අවධානය යොමු වේ. තව ද සාමාජීය කාර්යභාරයේ ම විශේෂ අංශයක් ලෙස අනුරාධපුර යුගයේ දී බෞද්ධ භික්ෂුවගේ සාමාජීය කාර්යභාරය වඩාත් පුළුල් හා සංකීර්ණ වූ ආකාරය භික්ෂුවගේ ජාතික කාර්යභාරය යටතේ හඳුනා ගැනීමට අපේක්ෂාකෙරේ.

ධර්මය හා විනය අර්ථ විවරණය කිරීම පදනම් කොට භික්ෂු සමාජයේ වාද විවාද හා අර්බුද ඇතිවීම බුදුරදුන් ජීවමාන කාලයේ පවා සිදු වූ බව ආදී බෞද්ධ මූලාශ්‍රයෙන් හෙළි වේ. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ද ඉතිහාසය පුරා එවැනි සිද්ධීන් හඳුනාගත හැකි ය. ථෙරවාද සම්ප්‍රදය මුල්කොටගත් ඓතිහාසික ධර්ම සංගායනාවන්ට ප්‍රධාන වශයෙන් පසුබිම් වන්නේ මෙම කාරණය යි. මේ හේතුව නිසාම ඉතිහාසය පුරා භික්ෂු සමාජය විවිධ සම්ප්‍රදය, නිකාය වශයෙන් කටයුතු කිරීම දැකගත හැකි ය. මෙම නිබන්ධයේ පස්වන පරිච්ඡේදය මගින් උත්සාහ ගන්නේ අනුරාධපුර යුගයේ එවැනි සම්ප්‍රදයයන් ලෙස හඳුනා ගත හැකි භික්ෂු කණ්ඩායම් වෙත ය. එහි දී ලංකාවේ මෙම සම්ප්‍රදයයන් බෙදීයාම සඳහා ප්‍රමුඛ වශයෙන් ධර්මමය කාරණාවන්ට වඩා විනය අර්ථ කථනය කිරීම ආදී හේතු ප්‍රමුඛ වූ බව හඳුනා ගනිමින් මහාවිහාර, අභයගිරි, ජේතවන, ධූතංගික යන භික්ෂු සම්ප්‍රදයයන්හි ආරම්භක පසුබිම, ඒ සඳහා බලපෑ හේතු සාධක, එම සම්ප්‍රදයයන් නියෝජනය කළ සඟ පරපුර, එම සම්ප්‍රදයයන්ගේ අනන්‍යතා ලක්ෂණ හා ඒවා සුරක්ෂිත කරගැනීම සඳහා එම භික්ෂූන්ගේ ක්‍රියාකාරකම් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමුවේ.

මේ ආකාරයට "අනුරාධපුර යුගයේ බෞද්ධ භික්ෂුව" නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය මගින් ශ්‍රී ලාංකේය බෞද්ධ සංස්කෘතියේ ස්වර්ණමය යුගය ලෙස සැලකිය හැකි අනුරාධපුර යුගයේ බෞද්ධ සංස්කෘතියේ ප්‍රබල භූමිකාවක් නිරූපණය කරන බෞද්ධ භික්ෂුවගේ ජීවිතයේ සියලු පැතිකඩ විමර්ශනයට ලක්කරමින් එම යුගයේ භික්ෂු ජීවිතයේ ස්වරූපය හඳුනා ගනිමින්, ආදි බෞද්ධ මූලාශ්‍රය මගින් භික්ෂුව වෙත පැවරුණු කාර්යභාරය ඉටුකිරීමට එම භික්ෂුව කොතෙක් දුරට කටයුතු කොට තිබේ දැයි විමර්ශනය කිරීමට අපේක්ෂා කෙරේ.